All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

21	S	I / II

Grade 10 – First Term Test – July 2023
පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023 ජූලි

කාලය : පැය 03
Time : 03 hours

Name: - ..... class: -..... Index no: - .....

සිංහල සාහිත්‍යය රසාස්වාදය

උපදෙස්

I හා II පත්‍ර සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේදී වෙන වෙනම භාර දිය යුතුය.
I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතුය.
II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.

I කොටස

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

i. සබඳ තොප විසින් මනුෂ්‍ය ලෝකයට ගොස් ඔක්කාක රජවරුන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත යුතු.

(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුද?

.....

(ආ) අග මෙහෙසියගේ නම කුමක්ද?

.....

ii. (අ) ඩබ්.ඒ. සිල්වාගේ සූරින්ගේ මුල්ම නවකතාව කුමක්ද?

.....

(ආ) ලීලා නවකතාවේ කතුවරයාගේ නම කුමක්ද?

.....

iii. (අ) ජාතක පොත රචනා වූයේ කුමන අවධියේද?

.....

(ආ) ජාතක කතාවල ආකෘතිමය වශයෙන් සමානය. ඒ සමානතා මොනවාද?

.....

iv. **පින්මද පුතුන් සියයක් ලදුවත්** **නිසරු**
ගුණැණැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු
එකපුන් සඳින් දුරුවෙයි ලොව ගණ අඳුරු
.....

(අ) සිව්වන පේළිය සම්පූර්ණ කරන්න.

.....

(ආ) ඉරිඇදි පද වල අර්ථය ලියන්න.

.....

(v) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

මෙලෙසින් වළන් උකා වියළා පලහා කුඹල්පාල පිරුහ. එයද කුඹල් දෙටුව නොයෙක් විසිතුරු අත්කම් දක්වා කරනලද වළන් ගෙන්වා ගෙන ගොස් රජ්ජුරුවන්ට දැක්විය. එකල මදු රජ්ජුරුවෝ හුදුටු විරුම වළන් දැක සතුටු ව මේ කලෝ කවුරු දැයි විචාරා කුඹලා විසින් මමය. ස්වාමීනි කී කල්හි තොපගේ කර්මාන්තය මම නොදනිම් ද නොවහළහා කියව යි තරව විවාළ සඳ දේවයන් වහන්ස මාගේ අතවැස්සා විසින් කරනලදැයි කීය.

එඹල ඒ තට අතවැසි කමට නිසි එකෙක් නොවෙයි. ඇදුරුකමට නිස්සෝය තෝ මෙතැන් පටන් උන්ගෙන් සිල්ප උගනුව තව ද එතෙම මෙතැන් පටන් මාගේ දරුවන්ට කෙළිවලන් කෙරේව යි. නිශ්‍යෝග කොට මේ ඔහට දෙවාලයි බෝධි සත්වයන්ට රන් මසු දහසක් යවා මේ කුඩා වළන් දරුවන්ට දෙව යි යවූහ. කුඹලා ද ඒ වළන් ඇරගෙන අන්ත:පුරගෙට ගොස් කෙළිවළන් ගෙනාමි කියා ය යවුයේය. එබස් අසා රාජකුමාරිකාවරු එතනට රැස්වූය. ඒ කුඹලා විසින් වළන් බෙදන සඳ බෝධි සත්වයන්ගේ ආනුභාවයෙන් ප්‍රභාවතීන් උදෙසා රූ නගා කරන වළන් ම උන්ට දින එසඳ ප්‍රභාවතී ඒ වළන් වල බෝධිසත්වයාගේ හා තමන්ගේ හා කුදගේ රූ දැක,

i. මේ ඡේදය අනුව මෙහි සිටින බලවත් පුද්ගලයාගේ ඇති හැකියාව කුමක්ද? (ලකුණු 4)

.....

.....

ii. කුඩා වළන් දෙන්නේ කවුරුන්ටද? (ලකුණු 4)

.....

.....

iii. මෙයින් පැහැදිලි වන්නේ කුඹලාගේ කුමන ගති ලක්ෂණද? (ලකුණු 6)

.....

iv. මේ අනුව බෝධි සත්වයන්ගේ අරමුණ කුමක් විය හැකිද? (ලකුණු 6)

.....

නොහිම් සුවඳ විහිදෙන කස්තුරි නිමල
උතුම් මුව නැබෙහි තැබි බඹනැණ විකල
විනම් මෙමට මහබඹු පැමි යම් කල
තබම් බොරු කියන දුදනන්ගේ දිව මුල

ලොවින් එකෙක් එක දෙයකට වෙයි සමත
වෙනින් අනෙක් දෙයකට අනෙකෙක් සමත
නොනිම් සුළඟ ලදුවත් තද ගිම් සැපත
ගොඩින් හැම දියෙන් රතය ද නොයනු ඇත

නොනිම් ලොව සියලු දේ දක්නා ඇසට
තමන් හැටි මදක්වත් නොපෙනෙන ලෙසට
අනුන් දොස දකිනි අනුවණ දන කපට
එමෙන් සිය නුගුණ නොදකිනි නියම කොට

සිසුමිත්‍ර පුහුණුවට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(i) මෙම පදය නිර්මාණකරුවාගේ අරමුණ කෙබඳුද?

..... (ල4)

(ii) කතුවරයා යොදා ඇති භාෂා උපක්‍රම මොනවාද?

..... (ල4)

(iii) බොරු කියන දුර්ජනයට සිදුවිය හැකිදේ මෙයින් පැහැදිලි වේ. ඒ කුමක්ද? (ල6)

.....

(iv) ලෝකයේ ජීවත්වන ඔනෑම මිනිසෙකු පිළිබඳ කියවෙන පදපේළිය ලියන්න. (ල6)

.....

II කොටස

සැලකිය යුතුයි.

පළමු වැනි ප්‍රශ්නය ද 02,03,04,05 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න 2ක් ද ඇතුළුව ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න. මේ සඳහා ලියන කඩදාසි භාවිතා කරන්න.

(01) I) පහත දී ඇති පද පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න. පිළිතුර වචන 200 ක් පමණ විය යුතුය.

කුලුණු ගණින් යුතු උතුමන් සිත — මහරු
දුදන බසින් නො යෙදෙයි කරනට — නපුරු
නව රුවනින් පිරිමහ සමුදුර — ගැඹුරු
තණ සුළඟින් උණු කළ හැකිවෙනි — කවුරු

රුදුරු ගිනි කඳක් ගති සදෙහි — වනතුරු
මිතුරු වේය දිගතින් හමන මඳ — මරු
මිතුරු නැසීමට එමවෙයි — පස මිතුරු
මිතුරු නෑ කෙනෙක් නිවතුන් හට — කවුරු

නපුරු කලට සත හට පැමිණෙන — වෙහෙස
එදුරු නො වෙයි කළ පව් පලදෙවා — මිස
තඹුරු වනය මුකුලිත වන බව — සවස
කවුරු විසින් වැළකිය හැකි මෙදිය — කුස

කුරිරු ගොර සපුන්ගේ දළ ගෙහි — විසය
මදුරු මැසි කැලැන්ගේ තුඩගෙහි — විසය
රුදුරු නුහුසුවන්ගේ වලගෙහි — විසය
නපුරු දුදනන්ගේ සියලගෙහිම — විසය

i. කවියා මෙහි කරුණා හරින වූ සත්පුරුෂ ගති ලක්ෂණ පැහැදිලි කරයි.

ii. පද්‍ය පන්තිය මගින් වර්තමාන සමාජයේ මිනිස් ගති පිළිබඳ විග්‍රහයකි.

iii. කවියා සත්ත්ව චරිත ද ඇදා ගනිමින් මනුෂ්‍ය ජීවිතයට උපදෙස් දේ.

iv. බුදු දහමේ අනිත්‍ය ස්වභාවය කියවේ. එහි යථා ස්වභාවය පැහැදිලි කරමින් විස්තර කරන්න.

v. මෙම පද්‍ය කොටස සර්ව කාලීන වටිනාකමක් ඇති බව,

(ල.6x5=30)

(02) කුස රජු හැරදමා ගිය පබාවතියගේ සිත දිනා ගැනීමට කුස කුමාරයා ගත් උත්සාහය ජාතක කතාවෙන් මැනවින් නිරූපණය වේ. නිදසුන් මගින් විමසන්න.

(03) අලගිය වැන්න මුකවැටිතුමා යම් උපදේශයක් දීම සඳහා සත්ත්ව චරිත හා ඒවායේ ක්‍රියාකාරකම් යොදා ගෙන ඇත. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(04) පබාවතියගේ චරිතයේ ගති ලක්ෂණ තුළින් උපහාස රසය ජනනය කළ ආකාරය විස්තර කරන්න.

(05) ජීවත් වීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන සුවිශේෂ ග්‍රන්ථයකි සුභාෂිතය, උදාහරණ තුනක්වත් දෙමින් පහදන්න.

(ල.15x2=30)

සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki ගවේෂණ පිවිසෙන්න